


# පරිගණකයේ මෙහෙයුම් පද්ධතිය වින්ඩෝස්

මීරිගම ඇකඩමි ඔෆ් කම්පියුටර් ස්ටඩීස් ආයතනයේ පාලන අධ්‍යක්ෂ

එන්.පී. විජේරත්න

**පුද්ගල පරිගණක සඳහා වූ මුල්ම මෙහෙයුම් පද්ධතිය වූයේ DOS ය. එය ප්‍රියජනක මෙහෙයුම් පද්ධතියක් නොවී ය. එයට එරෙහි පැමිණිලි,එමට තිබිණ. එබැවින් වසර කීපයකට පසුව මයික්‍රොසොෆ්ට් සමාගම මගින් වින්ඩොස් හඳුන්වා දෙන ලදී. එය තරමක් ආකර්ශනීය වුවත් දෝෂවලින් තොරවූවක් නොවී ය. කෙසේ වෙතත් පරිගණකයක් හැසිරවීම සඳහා මෙහෙයුම් පද්ධතියක් නැතිවම බැරි ය.**

මෙම ලිපිය සඳහා පාදක කරගෙන ඇත්තේ වින්ඩොස් 98 ය. එහෙත් මෙහි ඇති උපදෙස් එයට පෙර හාපසු සංස්කරණ වන වින්ඩෝස් 95 හා වින්ඩොස් ME සඳහා උපයෝගී කර ගත හැකි ය. කෙසේ වෙතත් මෙම ලිපි පෙලේ අරමුණ ඔබට පරිගණකයක් පරිශීලනය කරන අන්දම පැහැදිලි කර දීම ය. එබැවින් ඔබට වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය පිළිබඳව ගැඹුරින් තොරතුරු දැන ගැනීමට වුවමනා නම් 'මයික්‍රොසොෆ්ට් වින්ඩොස් තනිවම ඉගෙන ගන්න' වැනි පොතක් කියවන්න.

## මෙහෙයුම් පද්ධතියක් අවශ්‍ය ඇයි?


පරිගණක සඳහා මෙහෙයුම් පද්ධතියක් අනවශ්‍යයි මට සිතුන වාර අනන්ත ය.

(එහෙත් එය නිවැරදි සිතුවිල්ලක් නොවීය) මගේ පළමු DOS කම්පියුටරයේදී මම වරෙක ERASE DOS යන විධානය දුන්නෙමි. එහෙත් වාසනාවකට මෙන් හානිකර කිසිවක් සිදු නොවී ය.


සිදුවූයේ File not found යන පණිවිඩය දිස්වීම ය. ඩොස් මැකී ගියේ නැත. ඩොස් වින්ඩොස් මෙන් ම බලගතු මෙහෙයුම් පද්ධතියකි. පරිගණකය ධාවනය වීම සඳහා එය අවශ්‍ය ය. මෙහෙයුම් පද්ධතියක් යනු පරිගණකයේ දළාංග ඇතුළු හැම දෙයක්ම පාලනය කරන මෘදුකාංගයකි. ඔබට විවිධ ක්‍රියාකාරකම් කළ හැකි භාවිත යෙදුම් මෙහෙය වන්නේ ද එමගිනි. ඔබ මෙනුවකින් පද සකසනයක් තෝරා ගත්විට මෙහෙයුම් පද්ධතිය එය ධාවනය කරවයි. එය බැලූ බැල්මට ම සරල ය . ආශ්වාදජනක ය.

*ප්‍රධාන වශයෙන් කිසියම් මෘදුකාංගයක් ධාවනය කරවන මෙන්

**ඔබේ පරිගණකයේ ඇති ප්‍රධානම ක්‍රමලේඛය වින්ඩොස් ය. පරමාදර්ශී ලෙස පරිගණක මෙහෙයුම් පද්ධතියක් නිශ්චල ය. කාර්යක්ෂම ය. කිසි දිනක අකීකරු ලෙස කටයුතු කරන්නෙ නැත. ඔබ විසින් දෙනු ලබන විධාන නිසි ආකාරයට පිළිපදී. සත්‍ය වශයෙන්ම වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය දඟකාර ළමයකු වැනි ය.**




2 රූපය




1 රූපය




3 රූපය

ඔබ මෙහෙයුම් පද්ධතියට - එනම් වින්ඩෝස්වලට නියම කළ යුතු ය. මේ ගැන වැඩි විස්තර ඉදිරි ලිපියකින් ඉදිරිපත් කරන්නමු.

*ඔබ නිර්මාණය කරනු ලබන විවිධ ගොනු හා ලේඛන පාලනය කරන්නේ, හසුරුවන්නේ වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය මගිනි. එය මෙහෙයුම් පද්ධතියක් මගින් ඉටු කරනු ලබන වැදගත් මෙහෙයකි. ඔබේ පරිගණකයේ ඇති විවිධ ගොනු පිළිවෙලකට ක්‍රමවත්ව හාඩ් ඩිස්කයේ තැන්පත් කිරීමට මෙහෙයුම් පද්ධතියට පුළුවන.

*වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය මගින් ඉටු කරනු ලබන තෙවෙනි කාර්යය ඔබේ පරිගණකය විධිමත්ව ධාවනය කරවීම ය.

ඔබේ පරිගණකයේ ඇති ප්‍රධානතම ක්‍රමලේඛය වින්ඩොස් ය. පරමාදර්ශී ලෙස පරිගණක මෙහෙයුම් පද්ධතියක් නිශ්චල ය. කාර්යක්ශම ය. කිසි දිනක අකිකරු ලෙස කටයුතු කරන්නෙ නැත. ඔබ විසින් දෙනු ලබන විධාන නිසි ආකාරයට පිළිපදී. (මෙහිදී පරමාදර්ශී ලෙස යන පදය භාවිත කර ඇත්තේ කිසිම මෙහෙයුම් පද්ධතියක් සත්‍ය ජීවිතයේදී එසේ නොහැසිරෙන නිසා ය) සත්‍ය වශයෙන්ම වින්ඩොස් මෙහෙයුම් පද්ධතිය දඟකාර ළමයකු වැනි ය. පෙනුම ආකර්ශණීය වුවත් ඔබ නොරුස්සන විවිධ දේ එමගින් කෙරෙයි. ඔබගේ වැදගත් යමක් සඟවා ඇති ළමයෙක් ඔහු ප්‍රිය කරන යමක් නොකරන්නේ නම් සැඟවූ දෙය ආපසු නොදෙන ආකාරයට ම වින්ඩොස් ද කටයුතු කරයි. තවත් ආකාරයකට කිවහොත් ඔබ පරිගණකය පාලනය කරන්නේ වින්ඩොස් මගිනි. එබැවින් ඔබ වින්ඩෝස් මගින් ඉදිරිපත් කරන ලද කොන්දේසිවලට යටත් විය යුතු ය.

ටාස්ක්ස් බාර්වල දකින්නට ලැබෙන වැදගත් ම අයිතමය ස්ටාර්ට් බොත්තම ය. ඔබේ පරිගණකයේ ඇති ඕනෑම තැනකට පිවිසිය හැකි කෙටි මං සහිත මෙනු ව්‍යුහයක් එමගින් මතු කර ගත හැකි ය. ඒ සඳහා කළ යුත්තේ ස්ටාර්ට් බොත්තම ක්ලික් කිරීම ය. ඔබට ස්ටාර්ට් බොත්තම පෙනෙන්නට නැතත් ඕනෑම අවස්ථාවක කන්ට්‍රෝල් කී එක ඔබා අල්ලාගෙන එස්කේප් කී එක එබීමෙන් ද ස්ටාර්ට් මෙනුව මතු කර ගත හැකි ය

## ඩෙක්ස්ටොප් යනු කුමක්ද?

වින්ඩෝස් රූපකාරකාරයෙන් ( ග්‍රැෆිකලි) ක්‍රියාත්මක වෙයි. එබැවින් සෑම දෙයක්ම රූපක වශයෙන් නිරූපක (අයිකන්ස්) වශයෙන් පෙන්වයි. ඒවා ඩෙක්ස්ටොප් වශයෙන් හැඳින්වෙන පරිගණක පිවිසුම් තිරයේදී ඔබට දැක ගත හැකි ය. විශේෂයෙන් වෙනස් කර නැති නම් වින්ඩොස් පසුබිම් රූපකය වශයෙන් දිස් වන්නේ වලාකුළු සහිත අහස ය.


ඔබට මෙම නිරූපක මවුසයක උපකාරයෙන් පාලනය කළ හැකි ය. ඩෙකස්ටොප්වල දකින්නට ලැබෙන ඊ හිස හෙවත් පොයින්ටරය පාලනය කරන්නේ මවුසය මගිනි. පරිගණක තිරය මත දිස්වෙන විවිධ අයිතම හැසිරවීම කරන්නේ මවුස් පොයින්ටරය අදාළ අයිතමය මතට ගෙන ක්ලික් කිරීම (මවුසයේ වම් බොත්තම ක්ෂණිකව වරක් ඔබා අතහැරීම ) ඩ්‍රැග් කිරීම (තද කර ඇදගෙන යාම) ආදිය මගිනි. වින්ඩොස්වලදී විවිධකාරයෙන් ඉටු කර ගැනීම සඳහා යතුරු පුවරුව ද උපයෝගී කර ගත හැකි ය. එහෙත් රූපක මෙහෙයුම් පද්ධතිවලදී යතුරු පුවරුවට වඩා ඉක්මනින් මවුසය මගින් හැසිරවිය හැකියි.


* ඩෙක්ස්ටොප් යනු වින්ඩොස් මගින් එහි අන්තර්ගතය පෙන්වන පසුබිම යි.

* එහි ඇති කුඩා පිංතූර අයිකන්ස් හෙවත් නිරූපන යන නමින් හැඳින්වෙයි.

## කාර්යය තීරුව

වින්ඩොස් පිවිසුම් තිරයේ පහතින් ම ඇති අළු පැහැති තීරුව හඳුන්වන්නේ ටාස්ක්ස් බාරය හෙවත් කාර්යය තීරුව වශයෙන්. (1 රූපය) එය වින්ඩොස්වල ප්‍රධානතම පාලන මධ්‍යස්ථානය යි. එහි වම් කෙළවරේ ඇත්තේ ආරම්භක බොත්තම යි.






**4 රූපය**

(ස්ටාට් බටින්) ඔබ වින්ඩෝස්-වලදී සියළුම ක්‍රමලේඛ ආරම්භ කරන්නේ එමගිනි. එමෙන් ම වින්-ඩෝස් වැඩ වාරය අවසන් කිරීමට උපයෝගී කර ගත යුත්තේ ද මෙම ආරම්භක බොත්තම ය. ටාස්ක්ස් බාර්වල දකුණු කෙලවරේ ඇත්තේ සිස්ටම් ට්‍රේ එක ය. (2 රූපය) එහි අවම වශයෙන් ලවුඩ් ස්පීකරයක නිරූපකයක් හා මේ මොහොතේ වේලාව දකින්ට ලැබෙයි. මෙහි ඇති රූප සටහන් මෙන් එහි ඔබේ පරිගණකයේ ක්‍රියාත්මක වෙන වෙනත් ක්‍රමලේඛ නියෝජනය වෙන නිරූපක ද තිබිය හැකි ය. නාදජනක පද්ධතියක් නොමැති පරිගණකවල ලවුඩ් ස්පීකරයේ නිරූපකය දිස්වෙන්නෙ නැත. සිස්-ටම් ට්‍රේ එකේ දිස්වෙන අයිකනයක් ඩබල් ක්ලික් කිරීමෙන් අදාළ ක්‍රමලේඛයේ සැකසුම් කළ හැකි ය.

ඒ ඒ අවස්ථානුකූලව ටාස්ක්ස් බාර් එකේ මැද කොටසේ විවිධ බොත්තම් මතු වෙයි. එසේ මතුවන සෑම බොත්තමකින් ම ඒ අවස්-ථාවේ විවෘතව ඇති භාවිත යෙදු-මක හෝ වින්ඩෝවක නම දැක්-වෙයි. එහිදී යටට එබුන ස්වරූ-පයකින් දිස්වන්නේ ඒ අවස්ථාවේ විවෘතව ඇති භාවිත යෙදුම හෝ කවුළුව නියෝජනය වන බොත්-තම ය. එහෙත් වෙනත් බොත්ත-මක් මත ක්ලික් කළ වහාම එයට අදාළ වින්ඩෝව මතු වෙයි.

ස්ටාර්ට් බටින් එකට දකුණෙන් ඇත්තේ ක්වික් ලොන්ච් පෑඩ් එක ය.

(3 රූපය) (වින්ඩොස් 95 දී මෙය දකින්නට නොලැබෙයි) එහි ඇති අයිකනයක් ක්ලික් කළ වහාම එයට අදාළ භාවිත යෙදුම හෝ ක්‍රමලේඛය ප්‍රවේශනය වෙයි. ඔබ නිතරම වැඩ කරන භාවිත යෙදුම් කීපයක නිරූපක මෙතැනට එක් කළ හැකියි. වින්ඩෝස් පිහිටුවන අවස්ථාව ද සම්මත වශයෙන් මෙයට ෂෝ ඩෙක්ස්ටොප් ඉන්ටර්-නෙට් එක්ස්ප්ලෝරර් හා අවුට්ලුක් එක්ස්ප්‍රස් සඳහා වන රූපක (අයි-කන්ස්) එක්වෙයි.

## ස්ටාර්ට් බොත්තම හා ස්ටාර්ට් මෙනුව

ටාස්ක්ස් බාර්වල දකින්නට ලැබෙන වැදගත් ම අයිතමය ස්ටාර්ට් බොත්තම ය. ඔබේ පරිග-ණකයේ ඇති ඕනෑම තැනකට පිවිසිය හැකි කෙටි මං සහිත මෙනු ව්‍යුහයක් එමගින් මතු කර ගත හැකි ය. ඒ සඳහා කළ යුත්තේ ස්ටාර්ට් බොත්තම ක්ලික් කිරීම ය.

ඔබට ස්ටාර්ට් බොත්තම පෙනෙන්නට නැතත් ඕනෑම අවස්-ථාවක කන්ට්‍රෝල් කී එක ඔබා අල්ලාගෙන එස්කේප් කී එක එබී-මෙන් ද ස්ටාර්ට් මෙනුව මතු කර ගත හැකි ය. නව් යතුරු පුවරුවල වින්ඩෝස් සංකේතයෙන් නියෝජ-නය වන බොත්තම ක්ලික් කිරී-මෙන් ද ස්ටාර්ට් මෙනුව මතු වෙයි.

(4 රූපය) ස්ටාර්ට් මෙනුවේ දැක්වෙන ඇතැම් විකල්පවල නම්-වලට ඉදිරියෙන් දකුණට යොමුවූ ත්‍රිකෝණයක් දකින්නට ලැබෙයි. එයින් අදහස් වන්නේ එතැනට මවුස් පොයින්ටරය ගෙන ගිය විට අතුරු මෙනුවක් මතුවෙන බව ය. මෙය අත්හද බලන්න . විශේෂ-යෙන්ම ප්‍රෝග්‍රෑම් මෙනුවේ අතුරු මෙනු රාශියක් ම දැකිය හැකි ය. ❑

**අපි මීළඟ ලිපියෙන්**
**මයි කම්පියුටර් වින්ඩෝස්**
**එක්ස්ප්ලෝරර් හා**
**කන්ට්‍රෝල් පැනලය**
**පිළිබඳව**
**සාකච්ඡා කරමු**